## සාමාන්‍ය සමය විසිඑක්වන ඉරුදින | දේව ප්‍රකාශන

24-08-14

## පළමුවන දේව ප්‍රකාශනය

යෙසායා 22:15, 19-23

යෙසායා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"දාවිත්ගේ වංශයේ නිල යතුරු ඔහුට දෙනු ලබන්නේ ය."**

සියලු බලැති දෙවි ස්වාමීන් වහන්සේ මට කතා කොට, "රාජගෘහාධිකාරී ෂෙබ්නා වෙත ගොස් මෙසේ කියන්න මට නියම කළ සේක"යි දන්වන්න. සමිඳාණන් වහන්සේ නුඹේ නිලයෙන් නුඹ පහකර නුඹේ උසස් තත්ත්වයෙන් නුඹ පහතට හෙළාදමන සේක." සමිඳාණන් වහන්සේ ෂෙබ්නාට මෙසේ වදාළ සේක "එසේ සිදු වූ විට හිල්කියාගේ පුත්‍ර වූ මාගේ මෙහෙකරු වන එලියාකිම්ට මම අඬගසන්නෙමි. නුඹේ නිල සළුව ඔහුට හඳවා, නුඹේ පටිය ඔහුගේ ඉඟටියේ බැඳ නුඹේ ආධිපත්‍යය මම ඔහුට පවරා දෙමි. ඔහු ජෙරුසලමේ සෙනඟටත්, ජුදාවේ වංශයටත් පියකු මෙන් වනු ඇත. දාවිත්ගේ වංශයේ නිල යතුරු ඔහුට දෙනු ලබන්නේ ය. ඔහු අරින දේ කිසිවෙක් නොවසන්නේ ය. ඔහු වසන දේ කිසිවෙක් නාරින්නේ ය. මම සවිකළ ඇණයක් මෙන් ඔහු සිය තනතුරෙහි තිරසර ලෙස පිහිටුවන්නෙමි. ඔහුගේ මුළු වංශයට ඔහු ගෞරවයක් වන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. | දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 138:1-3, 6, 8

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ ප්‍රේමය සදා පවත්නේ ය.

ගීය: සමිඳුනි, හද පත්ලෙන් ඔබට තුති කරන්නෙමි. දෙවිවරුන් ඉදිරියෙහි ඔබට ගී ගයා ඔබ පසසන්නෙමි. ඔබේ ශුද්ධ මාලිගාව දෙස බලා නමස්කාර කරමින් ඔබේ කරුණා ගුණය සහ විශ්වාසවන්තභාවය නිසා ඔබේ නාමයට තුති පුදන්නෙමි.

ඔබේ නාමයත්, ආඥාත් උත්තරීතර බව ඔබ වහන්සේ පෙන්වූ සේක. මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන් සේක; මාගේ සිත සවි කොට, මට ධෛර්යය දුන් සේක.

සමිඳාණෝ උසස් නමුත්, පහත් අය සලකන සේක. එහෙත්, උඩඟු අය දුර සිට ම හැඳිනගන්න සේක. සමිඳාණෝ මා සම්බන්ධ ව අදහස් කරන දේ ඉටු කරන සේක. සමිඳුනි, ඔබේ ප්‍රේමය සදා පවත්නේ ය. ඔබ ඇරඹුවා වූ දේ නිම කළ මැනව.

## දෙවන දේව ප්‍රකාශනය

රෝම 11:33-36

පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**සියල්ල මවා වදුරන්නේ උන් වහන්සේ ය.**

දෙවියන් වහන්සේගේ වරප්‍රසාද සම්භාරය කෙතරම් විශාල ද? උන් වහන්සේගේ ප්‍රඥාව සහ ඥානය කෙතරම් ගැඹුරු ද? උන් වහන්සේගේ විනිශ්චයන් කෙතරම් අචින්ත්‍ය ද? උන් වහන්සේගේ ක්‍රියා මාර්ග කෙතරම් වර්ණනා විෂයාතික්‍රාන්ත ද? ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ කියා ඇත: "සමිඳුණන් වහන්සේගේ සිත තේරුම්ගත්තේ කවරෙක් ද? උන් වහන්සේට පුරෝහිතයා වූයේ කවරෙක් ද? උන් වහන්සේගෙන් ප්‍රතිඵලයක් ලබන පිණිෂ පළමුකොට උන් වහන්සේට යමක් දුන්නේ කවරෙක් ද?"

මන්ද සියල්ල මවා වදාරන්නේ උන් වහන්සේ ය; සියල්ල රක්ෂා කරන්නේ උන් වහන්සේ ය; සියල්ල අර්ථාන්විත කරන්නේ උන් වහන්සේ ය. උන් වහන්සේට සදහට ම මහිමය වේ වා! ආමෙන්.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සුපුවත් ජය නද** මතෙව් 16 :18

ආලේලූයා! ආලේලූයා

"මම ඔබට කියමි: ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටුවලට වුව ද, එය පරාජය නොකළ හැකි ය"යි සමිඳාණෝ වදාරණ සේක.

ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** මතෙව් 16:13-20

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි."**

ජේසුස් වහන්සේ පිලිප්පි කායිසාරියේ පෙදෙස්වලට පැමිණි කල, "මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිස්සු කියත් ද"යි සිය ශ්‍රාවකයන්ගෙන් ඇසූ සේක. ඔව්හු කතා කොට, "සමහරෙක්, 'ස්නාවක ජොහන් ය' කියා ද සමහරෙක්, 'එළියා ය' කියා ද, අන් සමහරෙක් 'ජෙරෙමියා නොහොත් දිවැසිවරයන්ගෙන් කෙනෙක් ය' කියා ද කියති"යි කී හ. "එහෙත් ඔබ මා කවරෙකු කියා කියන්නහු ද"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. සීමොන් පේදුරු උත්තර දෙමින්, "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය"යි කී ය. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "ජෝනාගේ පුත් සීමොන්, ඔබ ඉතා භාග්‍යවන්ත ය. මන්ද, ස්වර්ගයෙහි වැඩවසන මාගේ පියාණන් වහන්සේ විසින් මිස මනුෂ්‍ය මඟකින් මෙය ඔබට එළිදරව් නොකරන ලද්දේ ය. මම ඔබට කියමි: ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටුවලට වුව ද, එය පරාජය නොකළ හැකි ය. ස්වර්ග රාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නෙහි ද එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය"යි වදාළ සේක. තවද, තමන් ක්‍රිස්තුන් වහන්සේ බව කිසිවෙකුට නොකියන ලෙස උන් වහන්සේ ශ්‍රාවකයන්ට අණ දුන් සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.